# නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය

සමාජ සුභසාධන අංශය

வீடமைப்பு மற்றும் சமூக நலன்புரி அமைச்சு

சமூக நலன்புரி பிரிவு

## Ministry of Housing and Social Welfare

Social Welfare Division

I වන මහල, "සෙත්සිරිපාය"2 අදියර, බත්තරමුල්ල/1 வது மாடி, "செத்சிறிபாய" 2வது கட்டம், பத்தரமுல்லை/1st Floor, "Sethsiripaya" 2nd Stage, Battaramulla


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | MSWPI/NSPD/01චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2018.12.10 |

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2018 / 03

සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම</u>**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ආබාධ සහිත තැනැත්තන්ට හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට හෝ ස්වයංරැකියාවක් ආරම්භ කිරීම සඳහා හෝ දැනට කර ගෙන යන ස්වයංරැකියාව වැඩි දියුණු කර ගැනීම සඳහා හෝ ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර ලබා දෙන උපරිම ආධාර මුදල රු. 25,000/- ක් වේ.

02. මෙම ආධාරය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් සහ ඊට අදාළ ප්‍රගති වාර්තා සඳහා වන ආකෘතිපත්‍ර මේ වන විට සියලු ම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී ඇති අතර මහලේකම් කාර්යාලයේ වෙබ් අඩවියෙන් ද බාගත කර ගත හැකි ය.

03. ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණෙන් සිදු කෙරෙන මෙම වැඩසටහන මඟින් අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අයදුම්පත් සම්පූර්ණ කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සම්බන්ධයෙන් වූ උපදෙස් මාලාවක් මෙම චක්‍රලේඛයෙහි අන්තර්ගත වේ.

<u>ස්වයංරැකියා ආධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්ණායක :-</u>

- ස්වයංරැකියා ආධාරය ඉල්ලුම් කරන්නේ ආබාධ සහිත තැනැත්තකු වෙනුවෙන් විය යුතු ය. (රෝගීන් සඳහා ස්වයංරැකියා ආධාර දෙනු නොලැබේ.)
- ඉල්ලුම්කරු (ආබාධිත තැනැත්තා හෝ ඔහු/ඇය වෙනුවෙන් ස්වයංරැකියාවේ යෙදෙන පුද්ගලයා) වයස අවුරුදු 60ට අඩු පුද්ගලයකු විය යුතු ය.
- මාසික ආදායම රු. 6,000/-ට වඩා අඩු තැනැත්තකු විය යුතු ය.

<u>ස්වයංරැකියා ආධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන:-</u>

- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත (අඩු ආදායම්ලාභියකු බව සනාථ කරන ග්‍රාම නිලධාරී නිර්දේශය, සමාජ සේවා නිලධාරී නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම්කරු ඇඟිලි සලකුණ යොදන්නේ නම් එය ග්‍රා.නි. / ස.සේ.නි./ ප්‍රා.ලේ. සහතික කළ යුතු ය.)
- ඉල්ලුම්කරුගේ අත්සනින් යුත් ස්වයංරැකියා ආධාර ඉල්ලීම් ලිපිය

(2 පිටුවට....


ගරු අමාත්‍යතුමා / கௌ. அமைச்சர் / Minister :- Tel : 011-2867163 Fax : 011-2861770 E-mail : minister@housecomin.gov.lk

ලේකම් / செயலாளர் / Secretary Tel: 011-2862225 Fax :- 011-2864765 E-mail- info@mpi.gov.lk

අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director :- 0094 -11-2863416 Fax :- 0094 -11-2863416 E-Mail : mssnspd@gmail.com

කාර්යාලය / அலுவலகம் / Office Tel :- 0094 -11-2877374 Fax :- 0094 -11-2877374

"සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල//1st மாடி, 2வது தளம் "செத்சிறிபாய", பத்தரமுல்லை /1st Floor, Stage ii, "Sethsiripaya", Battaramulla.

- ❖ අයදුම්කරුගේ ආබාධිත ස්වභාවය, පවුල් පසුබිම හා ස්වයංරැකියාව කිරීමට ඇති හැකියාව පිළිබඳ තොරතුරු ඇතුළත් ව්‍යාපෘති වාර්තාව (ඇමුණුම 01) ස.සේ.නි./ සං.නි. විසින් ඉදිරිපත් කළ යුතු ය.
- ❖ ස්වයංරැකියාව සඳහා රු. 25,000/-ට වැඩි මුදලක් අවශ්‍ය නම් ඉතිරි මුදල් සපයා ගන්නා ආකාරය සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන්/ ආයතන මඟින් ලබාගත් ලිපිය
- ❖ ප්‍රාදේශීය වශයෙන් සපයා ගන්නා උපකරණ/ අමුද්‍රව්‍ය සඳහා ඉදිරිපත් කරන මිල ගණන් සාධාරණ බවට ග්‍රා.නි./ ස.සේ.නි./ සං.නි.ගේ සහතිකය
- ❖ උපකරණ/ අමුද්‍රව්‍ය වෙළෙඳපොලෙන් මිලදී ගන්නේ නම් ඒවා සඳහා අදාළ වෙළෙඳපොලෙන් ලබා ගත් මිළ ගණන් කැඳවූ ලිපි (මුදල් ගෙවූ බිල්පත් ඉදිරිපත් නොකළ යුතු ය.)
- ❖ එම උපකරණ/ අමුද්‍රව්‍ය ස්වයංරැකියාව සඳහා ම යොදා ගන්නා බවට ඉල්ලුම්කරුගේ අත්සන සහිතව ස.සේ.නි./ සං.නි.විසින් සහතික කරන ලද ලිපියක්
- ❖ රජයේ වෛද්‍යවරයකුගේ අත්සන හා නිලමුද්‍රාව සහිත, මාස 6ක් ඇතුළත ලබා ගත්, ආබාධ සහිත බව පැහැදිලිව සඳහන් වෛද්‍ය සහතිකය (රෝග නිශ්චය වාර්තාව ප්‍රමාණවත් නොවේ.)
- ❖ ස්වයංරැකියාව සත්ත්ව පාලනයට අදාළ නම් පශු වෛද්‍ය වාර්තාව

<u>සැලකිය යුතු වෙනත් කරුණු</u>

- ❖ සිල්ලර වෙළඳාම් සඳහා ආධාර ලබා දෙනු නොලැබේ.
- ❖ සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් ඇති බැවින් මෙම ආධාරය ලබා දීමට සුදුසු ම තැනැත්තන් තෝරා ගෙන ඔවුන්ට පමණක් අයදුම්පත් නිකුත් කරන්නේ නම් මැනවි.

04. ස්වයංරැකියා ආධාර ලබා දීමෙන් මාස තුනකට සහ අවුරුද්දකට පසු එම ස්වයංරැකියාවේ ප්‍රගතිය ඇතුළත් පසුවිපරම් වාර්තා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත ලිපිනයට එවීම අනිවාර්ය බව සලකන්න.

අධ්‍යක්ෂ
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
පළමු මහල
සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල

එස්.ඩී. උඩවත්ත
අතිරේක ලේකම් (පාලන)

පිටපත් :- 1. ප්‍රාදේශීය ලේකම් - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
2. සමාජ සේවා අධ්‍යක්ෂ - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
3. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී - අවශ්‍ය කටයුතු සඳහා